# පළමු වැනි විජයබාහු රජු හා සබැඳි ඓතිහාසික ස්ථානවලින් හමුවන යබොර අවශේෂ පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

දර්ශන බණ්ඩාර* හා සම්පත් ප්‍රසන්න

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
manojbandara35@yahoo.com

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රජවරුන් අතුරින් පළමු වැනි විජයබාහු රජු සැළකෙන්නේ රණකාමී හා ශ්‍රේෂ්ඨ පාලකයෙකු වශයෙනි. අඩසියවසකට ආසන්න කාලයක් දිවයිනේ පැවති චෝළ බලය පරාජයට පත්කොට පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය බවට පත් කරගත් පළමු වැනි විජයබාහු රජු ජන්ම ලාභය ලබා ඇත්තේ රෝහණ දේශයේ බවට මූලාශ්‍ර සාධකවලින් පැහැදිලි වේ. පළමු වැනි විජයබාහු රජතුමා හිරඤ්ඤමලය හෙවත් රම්මලේ කඳුවැටිය ආසන්න ප්‍රදේශයේ උපත ලබා තරුණ වියෙහි එම ප්‍රදේශයේ වාසය කළ බවට මූලාශ්‍ර අනුව පැහැදිලි වේ. රජරට චෝල පාලනයට නතු ව පැවති අවධියක රෝහණයේ වාසය කල රජ පවුල තම ආරක්ෂාව පතා දුර්ග මාර්ගවලින් හෙබි සතුරන්ට පහසුවෙන් ලිගාවිය නොහැකි ආරක්ෂක මධ්‍යස්ථානවල වාසය කළ බව හඳුනාගත හැකි ය. පළමු වැනි විජයබාහු රජු මූලික ව වාසය කළා යයි සැළකෙන රම්මලේ කඳුකර ප්‍රදේශය රෝහණයේ දීර්ඝ ප්‍රදේශයක ව්‍යාප්ත ව පැවත් ඇති අතර ආරක්ෂක මධ්‍යස්ථානයක පැවතිය යුතු අංග ලක්ෂණවලින් යුක්ත වේ. සතුරන්ගෙන් ආරක්ෂා වීමට අමතර ව භූ ගෝලීය වශයෙන් ඇති සම්පත් සක්‍යතාව ද මෙහි දී වැදගත් වේ. රන්මලය කඳු වැටිය අවට ප්‍රදේශවල ඉහළ ජල පෝෂක ප්‍රදේශයක් වන අතර යකඩ නිෂ්පාදනයට අවශ්‍යවන යපස්වලින් ද පොහොසත් භූමි ප්‍රදේශයක් වේ. රන්මලේ කඳු පාමුල ඇති ජනාවාසවල විජයබාහු රජු පිළිබඳ ව නූතනයේ පවා ජනශ්‍රැති සාධක පවතී (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2013). පළමු වැනි විජයබාහු රජු ප්‍රධාන ආරක්ෂකයා හා ජයග්‍රහණවල නියමුවා වූ බුදල්නාවන් සෙනෙවි ද වාසය කර ඇත්තේ රම්මලේ කඳු පන්තිය පාමුල පිහිටි මෙලොක්ගමුව ප්‍රදේශයේ ය. විජයබාහු රජුගේ කාලයට අයත් පනාකඩුව තඹ සන්නස මඟින් ද මෙම ප්‍රදේශයේ ඓතිහාසිකත්වය තහවුරු වේ. විජයබාහු රජු වඩාත් කීර්තිමත් වන්නේ ප්‍රබල චෝල අධිරාජ්‍යයාට එරෙහි ව දියත් කරන ලද විමුක්ති අරගලය නිසා ය. විජයබාහු රජුගේ යුද්ධය සිදහා අවශ්‍ය වූ මානව හමුදා ශක්තිය මෙන් ම ආයුධ බලයට ද ඔහුගේ ජන්ම ප්‍රදේශයේ යම් දායකත්වයක් ලැබුනේ ද යන්න විමසා බැලීම වැදගත් වේ. එහි දී මෙම ප්‍රදේශය ආශ්‍රයෙන් හමුවන යකඩ නිෂ්පාදනයේ යබොර අවශේෂ විසිර පවත්නා ප්‍රදේශවලින් ලැබෙන සාධක වැදගත් වේ. විජයබාහු රජු හා සම්බන්ධ ඓතිහාසික ස්ථාන වන තුන්බැවුල රජමහා විහාරය, මොලොක්ලමුව, රම්මලේ හා කිරම ආදී ප්‍රදේශවලින් හමුවන යබොර අවශේෂ පිළිබඳ ව මෙම පත්‍රිකාවෙන් තොරතුරු සාකච්ඡාවට ලක් වේ.

## පර්යේෂණ ගැටලුව

පළමු වැනි විජයබාහු රජුගේ ජන්මභූමිය වන රෝහණයට අයත් රම්මලේ කඳු පන්තිය පාමුල ප්‍රදේශය පිළිබඳ සිදුකල ගවේෂණයක් ඇසුරින් මෙම අධ්‍යයන පත්‍රිකාව සකස්කර ඇත. මෙහි දී අපට මතු වූ ප්‍රධාන අධ්‍යයන ගැටලුව වන්නේ "රම්මලේ කඳු පාමුලින හමුවන යබොර අවශේෂ පළමු වැනි විජයබාහු රජුගේ ආරක්ෂක භූමියෙහ

ඉතිහාසය ප්‍රත්‍යාපමාණයට උපකාරී වන්නේ කෙ සේ ද?" යන්නයි. මෙම අධ්‍යයන ගැටලුව විසඳීමේ දී අවධානය යොමු වූ අධ්‍යයන ප්‍රශ්න ගණනාවකි. ඒ අනුව, රම්මලේ කඳු ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකම කුමක් ද? ප්‍රදේශයේ පවතින පුරාවිද්‍යාත්මක අවශේෂ මොනවා ද? මෙම යබොර අවශේෂ විසිර ඇති ප්‍රදේශ මොනවා ද? ප්‍රදේශයේ ඉතිහාසය ගොඩනැගීම සිදහා යබොර අවශේෂවලින් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද? යබොර අවශේෂ සමිග හමුවන අනිකුත් පුරාවිද්‍යාත්මක සාධක මොනවා ද? ආදී ගැටලු ගණනාවක් අපගේ අවධානයට යොමු වි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදහා යොදා ගත් ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍ර සමීක්ෂණ ක්‍රමවේදයයි. ඒ අනුව රම්මලේ කඳු ප්‍රදේශය පිළිබිද ව සිතියම් ආශ්‍රිත ව මූලික කරුනු සොයා බැලීම හා අදාල ගමන් මාර්ග හඳුනා ගැනීම සිදු වි ය. ඉන් අනතුරු ව අදාල ක්ෂේත්‍රයේ පිහිටි පුරාවිද්‍යාත්මක අවශේෂ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලද අතර " තුන් බැවුල රජමහා විහාරය" පළමු වැනි විජයබාහු රජු වාසය කළ ස්ථානයක් ලෙස සොයා ගන්නා ලදි. දීර්ඝ කරුණු විමර්ශනයකින් පනාකඩුව තඹ සන්නස හා බුදල්නාවන්ගේ සොහොන මෙම විහාර පරිශ්‍රයේ තිබූ බවට පිළිගත හැකි සාධක හමු වි ය. තුන්බැවුල විහාරය ආසන්නයේ පැවති ප්‍රදේශයකින් යබොර සාධක හඳුනාගත හැකි වි ය. මෙම යබොර සාධක විශාල ප්‍රදේශයක පැතිර පැවති අතර ආසන්න ප්‍රදේශවල මේ පිළිබිද ගවේෂණ කටයුතු සිදු කරන ලදි. රම්මලේ කඳුකරයට අයත් රම්මලේ කන්දේ සිට වරාපිටිය වැව දක්වා ප්‍රදේශ ගණනාවකින් ද යබොර අවශේෂ මෙහි දී හමු වි ය. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ මෙම ස්ථානය පිළිබිද GPS අංකනය සිදුකළ අතර ඡායාරූප ගැනීම ද මෙහි දී සිදු වි ය. එ මෙන් ම දැනට හමුවන යබොර අවශේෂවලට සිදු ව ඇති මානුෂ ක්‍රියාවන්හි තීව්‍රතාව ද (Impact the Recent Site Modification) මෙහි දී විමසා බලන ලදී.

## රම්මලේ කඳු පන්තිය ආශ්‍රිතව හමුවන යබොර අවශේෂ

ඓතිහාසික රම්මලේ කඳු පන්තිය හා බැඳුණු ඓතිහාසික කථා ප්‍රවෘත්තීන් හා ජනශ්‍රැති රාශියකි. එ මෙන් ම ඉපැරණි යකඩ නිෂ්පාදනයට අයත් යබොර පරිශ්‍ර විශාල ප්‍රමාණයක් හඳුනාගත හැකි වි ය (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2011-2013). ප්‍රදේශයේ පැවති තත්ත්වය අනාවරණය සිදහා මෙම පුරාවිද්‍යා පරිශ්‍ර ඉවහල් කරගත හැකි ය.

## අධ්‍යයන ක්ෂේත්‍රයේ ස්වභාවය

විජයබාහු රජු හා බැඳි ඓතිහාසික තොරතුරු ගෙතුණු තුන්බැවුල රජමහා විහාරය අවට ප්‍රදේශය, උස් කඳු පන්තිවලින් ආවරණය වූ ප්‍රදේශයක් වේ. ආරක්ෂිත මධ්‍යස්ථානයක් වශයෙන් වැදගත් ගුහා ආවරණ, ස්වාභාවික දිය දහරා හා ගස්වැල් මිගින් ආවරණය වූ අප්‍රකටව විසීමට යෝග්‍ය ස්ථාන ඒ අතර වි ය (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2013). එ මෙන් ම තුන්බැවුල රජමහා විහාරය ඉතා ආසන්න ව විවිධ ප්‍රමාණවලින් යුක්ත යබොර අවශේෂ හඳුනාගත හැකි වි ය. එහි ව්‍යාපති පිළිබඳ අධ්‍යයනයේ දී පැහැදිළි වූ කරුණ වූයේ විහාරස්ථානය හා එම යබොර පරිශ්‍ර අතර කිසියම් සබධතාවක් ඇති බවයි. විශේෂයෙන් ම පෞරාණික ලෙන් විහාරයට අමතර ව කුඩා ලෙනක්, බුදල්නාගේ ස්මාරකය යැයි විශ්වාස කරන ගොඩැල්ලක්, පොකුණු 2ක්, විහාර පරිශ්‍රයේ හමුවන විවිධ වර්ගයේ මැටි අවශේෂ (ගඩොල්, උළු හා වලං වලට අයත් විය හැකි) හා විහාර පරිශ්‍රයෙන් හමු වූ නොයෙකුත් පුරාවස්තු උක්ත අදහසට සමීප හේතුන් වශයෙන් දැක්විය හැකි ය.

## තුන්බැවුල රජමහා විහාරය අසල අවශේෂ

විහාරස්ථානයට උතුරින් වූ ප්‍රදේශයේ යපස් කිසියම් ප්‍රමාණයකට ව්‍යාප්තවීමත්, ඒ ආශ්‍රිත ස්ථාන කිහිපයක යබොර අවශේෂ ද විවිධ ප්‍රමාණවලින් හඳුනාගත හැකි වි ය. $20m^2$-$50m^2$ පමණ ව්‍යාප්තියක් සහිත ස්ථාන 3ක් හා සුළු වශයෙන් යබොර කැබලි විසිර පවත්නා ස්ථාන කිහිපයක් වි ය. අමතර ව වලං කැබලි යම් ප්‍රමාණයකින් හමු වේ. රම්මලේ කන්ද ආශ්‍රිත ව හමුවන අනෙකුත පරිශ්‍ර (ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2010-2011) සියල්ලට ම වඩා විශේෂත්වයක් මෙම

ස්ථානයන්හි දී හඳුනාගත හැකි වි ය. යබොර හමුවන ස්ථානයන්හි දක්නට ඇති මධ්‍යම ප්‍රමාණයේ ගල් කුට්ටි පෘෂ්ඨයන් මතුපිට උණු වී ගලාගිය (අධික උෂ්ණත්වයකට ලක් ව) ස්වරූපයක් දැකගත හැකි වි ය. ඇතැම් විට යකඩ නිස්සාරණයේ දී තනාගන්නා උඳුන් බිත්ති සිදහා මෙම පාෂාණ පෘෂ්ඨයන්හි පිහිටීම උපයෝගී කරගත් බවට අනුමාන කළ හැකි ය. නැතහොත් යකඩ නිස්සාරණයේ දී ගලා ගිය යබොර පාෂාණ මතුපිට ආලේප වූවා විය හැකි ය. කුමන අයුරකින් එය සිදු වූවා දැයි නිගමනය අපහසු වී ඇත්තේ මතුපිට උණු වී ගිය ස්වභාවය දක්වන ස්ථානයන් හා පාෂාණයේ අවශේෂ කලාප එකම වර්ණයක් ගෙන තිබීමයි. මෙම කරුණ සම්බන්ධයෙන් නිවැරදි ව අනාවරණය කරගැනීම සිදහා තවදුරටත් අධ්‍යයනය කළ යුතු ව ඇත. ප්‍රදේශයේ වර්තමාන මානව ක්‍රියාකාරම් හේතුවෙන් පරිශ්‍රයේ මුල් ස්වරූපය බෙහෙවින් ම වෙනස් වී ඇත.

## රම්මලේ කඳු පන්තිය අවට යබොර පරිශ්‍ර හා අනෙකුත් පුරාවිද්‍යාත්මක ස්ථාන

රම්මලේ කඳු ප්‍රදේශයේ දීර්ඝකාලයක් තිස්සේ මානව ක්‍රියාකාරකම් පැවති බවට ඓතිහාසික මූලාශ්‍ර තරමක් දුරට විරල ය. නමුත් හමුවන පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන මිගින් ප්‍රදේශයේ පැවතියා වූ තත්ත්වය පිළිබිද නිගමනය කළ හැකි ය. ඒ අතුරින් සිත්තම්ගල්ලෙන විහාරය ඓතිහාසික කථා ප්‍රවෘත්තීන්වල කියැවෙන ස්ථානයක් සිදහා නිදසුන් වේ.

ප්‍රදේශය ආශ්‍රිත ව පැවති අතීත මානව ක්‍රියාකාරම් පිළිබිද සාක්ෂි වශයෙන් හමුවන යබොර අවශේෂ දැක්විය හැකි ය. කිරම, වරාපිටිය හා අඹගහහේන, අතපත්තුකන්ද, දේවාලේගම වැනි ප්‍රදේශවල බහුල ව හමුවන මෙම අවශේෂ තවදුරටත් වළස්මුල්ල ප්‍රදේශයට අයත් රාජපුරගොඩ, ගොරකාගහවත්ත, කුරුදුවත්ත හා පිටදෙණිය වැනි ප්‍රදේශ දක්වා ද ව්‍යාප්ත වෙනු හඳුනාගත හැකි ය. ඒ අනුව මෙ තෙක් හඳුනාගත් හා හඳුනා නොගත් අතිවිශාල ප්‍රමාණයක් වූ යබොර අවශේෂ මිගින් ප්‍රදේශයේ අතීතයේ පැවතියා වූ තත්ත්වය පිළිබඳ කිසියම් අදහසක් ලබා දෙයි.

## සමාලෝචනය

පළමු වැනි විජයබාහු රජු හා සම්බන්ධ ඓතිහාසික ස්ථාන ගණනාවකින් ම යබොර සාධක හමුවන බව පෙනී යයි. මෙම ස්ථාන වලින් යබොර හමුවීම හේතු කිහිපයක් නිසා වැදගත් වේ. විජයබාහු රජු නම් වූ ශ්‍රේෂ්ඨ යුධ සටන්කාමියාට අදාළ ප්‍රදේශයෙන් ලැබුණු ආයුධ සහය පිළිබිදව අධ්‍යයනය කිරීමේ දී, මෙ මිගින් කිසියම් දායකත්වයක් ලැබුනේ ද යන්න තවදුරටත් විමසිය යුතු ය. එ මෙන් ම ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස රම්මලේ කඳු ප්‍රදේශයේ පැවති වටිනාකම පිළිබිද ව ද මෙහි දී වැදගත් පරීක්ෂණයක් අපට සිදුකළ හැකි ය. නමුත් මෙම යබොර අවශේෂ නිශ්චිත ව පළමු වැනි විජයබාහු යුගයේ ම යැයි පැවසීමට නොහැකි වන්නේ ඒ සිදහා ගැඹුරු පර්යේෂණයක් මෙහි දී සිදු නොවුණු නිසා ය. නමුත් විජයබාහු රජුගේ ඓතිහාසික කාර්යය සාඵල්‍යය පිළිබිද විමසීමේ දී ඔහු එම යුගයට අයත් නොවූ බවට ද විශ්වාස කිරීම අපහසු ය.

## ආශ්‍රෙය ග්‍රන්ථ


ගුණසිංහ, පී.ඒ.ටී. (1968) පුරාතන රෝහණ රාජ්‍යය, නුගේගොඩ: දීපානි මුද්‍රණ ශිල්පීන් සහ ප්‍රකාශකයෝ

විජයසූරිය, විමල., (1987) රුහුණේ අප්‍රකට පුරාවස්තු. නුගේගොඩ: සූර්ය ප්‍රකාශන භාරය.

ඩෙව් දුටු ලංකාව. (2008) අනු: ඇහැලේපොළ එච්. ඇම්. සෝමරත්න. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

රෝහණ දේශයේ ඉතිහාසය (2003) සිරිමල් රණවැල්ල. රුහුණ විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි.

Cooray P.G. (1984) The Geology of Sri Lanka Colombo, National Museum of Sri Lanka.

Juleff, G. (1998) Early Iron And Steel In Sri Lanka, Germany, Impresco en Almeania.

Juleff, G. (1990) The Samanalawewa Archeological Survey, Ancient Ceylon, Vol 3, No, journal of the Archeological Survey Dept of SL, Colombo.